"ට්‍රැක් පැන්න හූල් කොමිසමෙන් ඉවත් කරමු!" යන මැයෙන් යුතුව මව්බිම පුවත්පතේ පළවූ ලිපියකි. මෙම ලිපියට ප්‍රස්තුතව තිබුණේ මහාචාර්ය රත්නජීවන් හූල් විසින් මැතිවරණය පැවැත්වීමට දින නියම කරගැනීම සම්බන්ධයෙන් මාධ්‍යයකට සිදුකළ ප්‍රකාශයකි. එහිදී මහාචාර්ය හූල් විසින් කළ ප්‍රකාශය සහ එවන් ප්‍රකාශයකට අදාළ වන පසුබිම තර්කානුකූලව ගොඩනංවමින් ලිපියක් ඉදිරිපත් කිරීම කිසිසේත්ම ගැටළුකාරී නොවේ. සිදුවිය යුත්තේද එයයි.කෙසේ නමුත් එම කරුණු කාරණා ඉදිරිපත් කිරීමට මහාචාර්ය හූල්ගේ ද්‍රවිඩ වාර්ගිකත්වය සඳහන් කිරීම අදාළ වන්නේ කෙසේද?

එසේම නිශ්චිත කරුණු කාරණා දැක්වීමක් වෙනුවට මහාචාර්ය හූල්ට එරෙහිව එල්ල කෙරෙනා පුද්ගලික ප්‍රහාරයන් මෙම ලිපියට ඇතුළත් වීමේ පදනම කුමක්ද? මෙම කරුණු දෙකම ලිපියට ඍජුව අදාළ නොවනා බැවින්, මව්බිම සිදුකර ඇත්තේ ජනමාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරිමක් නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #Ika #SinhalaPress #News #Mawbima